# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/48 - 2013 නොවැම්බර් මස 22 වැනි සිකුරාදා - 2013.11.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

උක්ත ශීර්ෂය යටතේ 2013 සැප්තැම්බර් මස10 වැනි දින ම විසින් අංක 1827/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* අංක 09-1041 යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*මගේ යොමු අංකය* : 150 /04/02/01/02.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: LD/05/2008/ WS/306.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගල්බොඩ කෝරළේ බටහිර සුළු කොට්ඨාසයේ අරම (මා ඔයෙන් නැගෙනහිර) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2013.06.28 දිනැතිව, මැන සකස් කරන ලද අංක කෑ 3431 දරන මූලික පිඹුරේ කැබලි අංක 1, 2 හා 3 වශයෙන් දැක්වෙන “යටිහේන හා අරම වත්ත *නොහොත්* අක්කර වත්ත’’ නැමති ඉඩම්වලින් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0796 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන:

1. කැබලි අංක 01

**ඉඩමේ නම: යටිහේන - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0197**

**මායිම් :**

උතුරට: මාර්ගය සහ යටිහේන (හිමිකම් පිඹුර 160011); නැගෙනහිරට: යටිහේන (හිමිකම් පිඹුර 160011); දකුණට: කැබලි අංක 2 සහ යටිහේන (හිමිකම් පිඹුර 160011); බස්නාහිරට: යටිහේන (හිමිකම් පිඹුර 160011) ;

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: 1. සිරිමා වැලිකුඹුර මහත්මිය, රහල, අරණායක.

02. කැබලි අංක 02

**ඉඩමේ නම: අරම වත්ත *නොහොත්* අක්කර වත්ත - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0319**

**මායිම් :**

උතුරට: මෙම පිඹුරේ කැබලි අංක 1 සහ මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1; නැගෙනහිරට: මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1; දකුණට: ඇල සහ මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1: බස්නාහිරට: මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1 සහ යටිහේන (හිමිකම් පිඹුර 160011)

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: 1. ජේ. වයි. චන්ද්‍රාවතී මහත්මිය, අක්කරවත්ත, අරම, අරණායක.

03. කැබලි අංක 03

**ඉඩමේ නම: අරම වත්ත *නොහොත්* අක්කර වත්ත - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0280**

**මායිම් :**

උතුරට: ඇල සහ මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1; නැගෙනහිරට: මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1; දකුණට: කලු උණ ඇල (මහනුවර දිස්ත්‍රික් මායිම) සහ මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1: බස්නාහිරට: මූලික පිඹුරු අංක කෑ 769 හි කැබලි අංක 1 සහ මූලික පිඹුරු අංක කෑ 3438 හි කැබලි අංක 2.

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: 1. ජේ. වයි. එම්. ගුණදාස බණ්ඩා මහතා, අක්කර වත්ත, අරම, අරණායක.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014 ජනවාරි මස 15 වැනි දින පෙ. ව. 10.00 ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014 ජනවාරි මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අනුර රාජරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2013 නොවැම්බර් මස 18 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 274

---

## ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි (සංශෝධිත)

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හේවාවිස්ස කෝරළේ උඩපිටිය ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අංක මු. පි. මහ. 2133 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම්කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.269 ක් වන බංගලාවත්ත නැමැති ඉඩම.

**1. කැබලි අංක 01 - බංගලාවත්ත - ප්‍රමාණය: හෙක්ටයාර් 0.269**

ඉඩමට හිමිකම් කියන අය:

රුලිමංගොඩ, දෙල්තොට පදිංචි ඕ. එම්. ලෙයිලා බිබී හා අංක 1169, මරදාන පාර, බොරැල්ල පදිංචි එස්. එච්. ඇම්. රාසික්, එස්. එම්. උම්මු නසීමා, එස්. එම්. සිත්ති මරලියා, එම්. එස්. සිත්ති උම්මා.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2014.01.22 වැනි දින පූ. භා. 11.00 ට දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2014.01.08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ජේ. පී. යූ. කේ. ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2013 නොවැම්බර් මස 20 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 276

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.